ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය
முதியோர்களுக்கான தேசிய செயலகம்
**National Secretariat for Elders**

ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය
கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சு
**Ministry of Rural Development, Social Security and Community Empowerment**

*සක්‍රිය වැඩිහිටි වියක් උදෙසා* - *செயலூக்கமான முதுமையை நோக்கி* - *Towards an active ageing*

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. : NSE/DEV/05/2 | ඔබේ අංකය / உனது இல. / Your No. | දිනය / திகதி / Date : 2025-05-14 |

සියළුම දිස්ත්‍රික් ලේකම්වරු වෙත,

**<u>"දිරිය පියස" නිවාස යෝජනා ක්‍රමය - 2025 (සමාජ ආරක්ෂණය ලැබිය යුතු වැඩිහිටියන් සහිත අඩු ආදායම්ලාභී පවුල් වෙනුවෙන් නිවාස ඉදි කිරීමේ වැඩසටහන)</u>**

ශ්‍රී ලාංකික වැඩිහිටි තැනැත්තන්ගේ සුභ සාධනය හා අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම හා ආරක්ෂා කිරීම සහ වැඩිහිටි තැනැත්තන්ට ආත්ම ගෞරවයක්, ස්වාධීනත්වයක් හා ගරුත්වයක් ඇතිව ජීවත් වීමට අවස්ථාව සලසා දීම අරමුණු කරගෙන 2000 අංක 09 දරණ වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතට අනුව වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව සහ ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය පිහිටුවා ඇත. ඒ අනුව වැඩිහිටි තැනැත්තන්ගේ සුභ සාධනය හා අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් වැඩිහිටියන්ගේ සමාජ ආරක්ෂණය ඇති කිරීම මෙහි කාර්යභාරයකි.

02) මෙම වර්ෂය තුළ ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය මගින් සමාජ ආරක්ෂණ අරමුදල යටතේ වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කිරීමට සැළසුම් කර ඇති අතර, ඒ අතරින් පිළිසරණ අවැසි අඩු ආදායම්ලාභී වැඩිහිටියන් සඳහා නිවාස ඉදිකිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීමට සැළසුම් කර ඇත. ඒ අනුව ඊට අදාළ උපදෙස් පත්‍රිකාව ඇමුණුම-01 මගින්ද, අයදුම් පත්‍රය ඇමුණුම - 02 මගින්ද, අදාල ගිවිසුම ඇමුණුම - 03 මගින්ද දක්වා ඇති අතර එම උපදෙස් අනුව අවශ්‍ය කටයුතු සිදු කරන මෙන්ද, දිස්ත්‍රික් කමිටුවේ නිර්දේශයන් සහිතව දිස්ත්‍රික්කයේ ප්‍රමුඛතා අනුපිළිවෙළට අනුව මෙම වැඩසටහන යටතේ ප්‍රතිලාභ හිමිවිය යුතු යෝජනා 3 අනුමත කර 2025 ජුනි 30 වන දිනට පෙර මා වෙත ලැබීමට කටයුතු කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

03) මේ සම්බන්ධව ඔබ දක්වන සහයෝගය ඉතා අගය කොට සලකමි.

කේ. චතුර මිහිදුම්

අධ්‍යක්ෂ

පිටපත්:-

01.සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත - කාරුණික දැනගැනීම පිණිස හා සුදුසුකම් සහිත පුද්ගලයන් හෝ පවුල් පිළිබඳ විස්තර අයදුම්පත්‍ර ප්‍රකාරව නිර්දේශයන් සහිතව 2025 ජුනි 30 දිනට පෙර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කිරීමට.

ලිපිනය : 2 වන මහල, D කොටස, සෙත්සිරිපාය - දෙවන අදියර, බත්තරමුල්ල.
முகவரி : 2ஆம் மாடி,தொகுதி D,செத்சிறிபாய-கட்டம் II,பத்திரமுல்லை
Address : 2nd Floor,Block D, Sethsiripaya- II Stage, Baththaramulla.
ඊ-මේල් / ஈ-மெயில் / E-mail : nsemss@gmail.com
ෆැක්ස් / பெக்ஸ் / Fax : 0112187015

දුරකථන / தொலைபேசி/ Telephone:
අධ්‍යක්ෂ / பணிப்பாளர் / Director : 0112187045
කාර්යාලය / அலுவலகம் / Office
සංවර්ධන අංශය :0112054164
ආයතන අංශය :0112054136
ගිණුම් අංශය : 0112054138